**චීනයේ එක්සිම් බැංකුව (හූනාන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2023**

---

චීනයේ එක්සිම් බැංකුව (හූනාන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කි.මී. 64.31 ක් දිග මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මේ යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කි.මී. 62.06 ක් පළාත් මාර්ග කි.මී. 2.25 ක් සහ පාලම් 13 ක් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ කාර්යයන් කොන්ත්‍රාත් එක සහ දෙක යන කොටස් 02 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 100 කට සමාන රු.මිලියන 20,300 ක් වන අතර ඉන් එ.ජ.ඩො. මිලියන 85 කට සමාන රු.මිලියන 17,930 ක් චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 15 කට සමාන රු. මිලියන 2,370 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2018 නොවැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2020 නොවැම්බර් 28 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා  විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (i) | මාර්ග සංවර්ධන අධිකාරියට රු. මිලියන 16,048.41 ක් වටිනා මාර්ග කි.මී. 73.1 ක් සහ පාලම් 14 ක් පිළිවෙලින් 2022 දෙසැම්බර් 31 දින සහ 2023 මාර්තු 31 දිනවලදී භාර දී තිබුණද, එම අගය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ මාර්ග සංවර්ධන අධිකාරියට භාර දුන් වත්කම් ලෙස සටහන් කර නොතිබුණි. | 16,048.41 | එකඟවෙමි.<br>ව්‍යාපෘතිය මෙම වත්කම් මාර්ග සහ පාලම් ලෙස වෙන් වෙන් වශයෙන් වර්ග කර ඇති අතර මෙම තොරතුරු ඔවුන්ගේ වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා මා.සං.අ. වෙත භාර දෙනු ඇත. | ගණකාධිකාරීවරයා මූල්‍ය ප්‍රකාශය අත්සන් කිරීමට පෙර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව සියලුම සිදුවීම් සහ ගනුදෙනු වාර්තා කර තිබේද යන්න පිළිබඳව සහතික විය යුතුය. |
| (ii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 05 හි 26 (අ) වගන්තියට අනුව, විදේශ ව්‍යවහාර මුල්‍ය අයිතම අවසන් විනිමය අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට (ERD) යොමු කරන ලද අතුරු ගෙවීම් සහතිකවල (IPCs) කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු ශේෂය වූ එ.ජ.ඩො. මිලියන 11.58 ක් අවසන් විනිමය අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කර නොතිබුණි. මේ නිසා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල රු. මිලියන 2,106.15 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2,106.15 | අතුරු ගෙවීම් සහතිකය සකස් කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතිකය සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු ශේෂය එ.ජ.ඩො. මිලියන 11.58 කට පරිවර්තනය කර ඇත. කෙසේ වෙතත්, එය වැරදීමකින් අවසන් විනිමය අනුපාතිකය භාවිතයෙන් ගලපා නොමැත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 05 හි 26 වගන්තියට අනුව සියලුම සිද්ධීන් සහ ගනුදෙනු වාර්තා කර තිබේද යන්න මූල්‍ය ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා සහතික විය යුතුය. |
| (iii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 28 (ආ) වගන්තියට අනුව, වත්කම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයට ගෙන ඒමට දරන ඕනෑම පිරිවැයක් දේපල පිරියත සහ උපකරණවල පිරිවැයට ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ඉතිරි රු. මිලියන 1,954.18 ක මුදල සහ වර්ෂය සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණ වියදම්, නිම කළ සිවිල් වැඩවල වටිනාකමට මාරු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ | 1,954.18 | අදාළ අන්තර් ගෙවීම් බිල්පත් සඳහා මුදල් ගෙවීමෙන් පසු සම්පූර්ණ කරන ලද සිවිල් වැඩවල පිරිවැය නිශ්චිතව දැනගත හැකිය. එම වටිනාකම ණය නියෝජිතායතනය විසින් 2023.12.31 දිනට ලබා දී නොමැති බැවින්, සම්පූර්ණ කරන ලද සිවිල් වැඩ වටිනාකමට මාරු නොකර එම අගය කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07 හි 28 වැනි වගන්තියට අනුව සියලුම සිද්ධීන් සහ ගනුදෙනු වාර්තා කර තිබේද යන්න මූල්‍ය ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා සහතික විය යුතුය. |

දී සිවිල් වැඩ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණක නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි අංක 753 (1) සහ (2) අනුව වත්කම් නිකුත් කිරීම සහ භාර ගැනීම සඳහා භාවිතා කරන පොදු ආකෘති අංක 141 සහ 219. | මුදල් රෙගුලාසි සමඟ සසඳන විට වත්කම් පැවරීම සහ භාර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් අසම්පූර්ණ ආකෘති පත්‍ර භාවිතා කර එක් එක් මාර්ගයට සහ පාලම් සඳහා වන පිරිවැය වෙන වෙනම ලබා නොදී රු. මිලියන 16,048 ක මාර්ග කි.මී. 73.31 ක් සහ පාලම් 14 ක් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දී තිබුණි. | එක් එක් මාර්ග සහ පාලම් වෙනුවෙන් වූ රු. මිලියන 16,048.41 ක වටිනාකමකින් යුත් සිවිල් වැඩ සඳහා සවිස්තරාත්මක ප්‍රකාශය මේ සමග ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුව එක් එක් වත්කම්වල සවිස්තරාත්මක පිරිවැය ලේඛණ සමඟ වත්කම් මා.සං.අ. වෙත පැවරිය යුතු අතර, ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය අනුව ප්‍රමාණවත් තොරතුරු නොමැතිව වත්කම් භාර දුන් නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |
| (ii) | විදේශ ණය ගිවිසුමේ අංක. 12.1(10) වගන්තිය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය අවසන් කළ දින සිට මාස හයක් ඇතුළත ව්‍යාපෘති අවසන් කිරීමේ සාරාංශ වාර්තාවක් ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණය ගිවිසුමට අනුව, ණය නියෝජිතායතනය විසින් කරන ලද ඉල්ලීම මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘති අවසන් වාර්තාව ණය ලබාදෙන අය (නියෝජිතායතනය) වෙත ඉදිරිපත් කළ යුතුය. නමුත් තවමත් එවැනි ඉල්ලීමක් ලැබී නොමැත. | ණය ගිවිසුමට අනුව අවසන් කිරීමේ සාරාංශ වාර්තාව ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ණය නියෝජිතායතනය සමඟ වූ ණය ගිවිසුමේ 2.3 වගන්තිය | ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘති කාලය 2021 සැප්තැම්බර් 28 දින අවසන් වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2022 සැප්තැම්බර් 28 දක්වා දීර්ඝ කර තිබුණි. දීර්ඝ කළ කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ | එකඟවෙමි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ණය නියෝජිතායතනයෙන් ණය කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට නොහැකි වූ අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. | | |
| (iv) | මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීමේ කමිටු නිර්දේශ සහ "ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක සමාලෝචනය කිරීමට පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව" | ව්‍යාපෘතිය 2023 ජනවාරි 31 දින වන විට වසා දැමිය යුතු අතර 2023 මාර්තු 31 වන විට කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නියමිත දිනට වසා නොතිබුණු අතර නිසි අනුමැතියකින් තොරව 2023 සැප්තැම්බර් 30 දින දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලයේ වැටුප් සහ නඩත්තු සඳහා රු. මිලියන 9.06 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රායෝගික ගැටළු සලකා බලා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය 2023.09.30 දක්වා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023.09.30 දින වන විට වසා දමා මා.සං.අ. හි අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක කර ඇත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

## 3. පද්ධති හා පාලන

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි මූල්‍ය ප්‍රකාශන වල රු. මිලියන 0.99 ක ගෘහභාණ්ඩ සහ උපාංග මා.සං.අ. වෙත භාරදී ඇති වත්කම් ලෙස පෙන්වා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම වත්කම් භෞතික වශයෙන් අධිකාරියට පැවරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවෙමි. වටිනාකම රු. මිලියන 0.99 ක් වූ ගෘහභාණ්ඩ සහ උපාංග මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති වත්කම් ලෙස පෙන්වා දී තිබුණද, ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා යම් යම් කාර්යයන් කිරීමට සිදු විය. එබැවින් ව්‍යාපෘතියට 2024 ජුනි මාසය දක්වා වත්කම් භාවිතා කිරීමට සිදු වූ අතර 2024.07.01 දින මෙම වත්කම් මා.සං.අ. වෙත පැවරීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි තොරතුරු හෙළි කිරීමට කටයුතු කළ යුතුය. |